# දිඹුලාගල කාශ්‍යප මාහිමි

කාලය පැය දෙකයි.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- (1), (2), (3), (4) උත්තර වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.

01. දිඹුලාගල කාශ්‍යප හිමියන් වැඩ විසූ සමය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශයක් ඇතුළත් වර්ණය වන්නේ,

1. අභ්‍යන්තරික දේශපාලන වියවුල්වලින් ගහණ වීම
2. ගණින්නාන්සේ නමින් හැඳින්වූ භික්ෂු පිරිසක් වාසය කිරීම
3. ලාංකේය භික්ෂු සංස්ථාවේ පරිහානිය ලක්ෂණ ඇතිව තිබීම
4. දකුණු ඉන්දියානු චෝළ පාණ්ඩ්‍ය ආක්‍රමණ

02. පොළොන්නරුව රාජධානියේ පළමුවෙන්ම රාජ්‍යත්වයට පත් වූ රජතුමා වන්නේ,

1. පළමුවන කාශ්‍යප රජතුමා ය.
2. මහා වික්‍රමබාහු රජතුමා ය.
3. මහා විජයබාහු රජතුමා ය.
4. පරාක්‍රමබාහු රජතුමා ය.

03. මහා විජයබාහු රාජ්‍ය කාලයේ බුරුමයේ රජ කළ රජුගේ නම වන්නේ,

1. වික්‍රමසිංහ රජු
2. අනුරුද්ධ රජු
3. අලොංසිතු රජු
4. අශෝක රජු

04. මහා විජයබාහු රජතුමා විසින් කළැයි සැලකෙන දේ අතර වැරදි අදහස වන්නේ,

1. උපසම්පදා පුණ්‍යකර්මය නැවත මෙරටෙහි ඇති කිරීම
2. තුන් නිකාය සමගි කරවීම
3. වෙහෙර විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම
4. මහාවිහාරය විනාශ කිරීම

05. පරාක්‍රම සමුද්‍රය නිර්මාණය කළේ,

1. විජයබාහු රජු ය.
2. පරාක්‍රමබාහු රජු ය.
3. නිශ්ශංකමල්ල රජු ය.
4. වසභ රජු ය.

06. දිඹුලාගල කාශ්‍යප හිමියන් වැඩ විසූයේ,

1. මහා විහාරයේ ය.
2. අභයගිරියේ ය.
3. දිඹුලාගල ආරණ්‍යායතනයේ ය.
4. ජේතවන විහාරයේ ය.

07. 'මහාථෙර, සංඝපරිනායක' යන විශේෂ නාමවලින් හඳුන්වා ඇති යතිවරයන් වහන්සේ වන්නේ,

1. බුද්ධඝෝෂ හිමි
2. බුද්ධදත්ත හිමි
3. දිඹුලාගල කාශ්‍යප හිමි
4. උපසේන හිමි

08. විනය පිටකයට කළ ටීකාවේ නම වන්නේ,

1. වංසත්තප්පකාසිනී  2. මධුරත්තවිලාසිනී
3. සාරත්ථදීපනී  4. සද්ධම්මජොතිකා

09. 'විසාරදං තෙපිටකං- විනයඤ්ඤූ විසෙසතො' යනාදි වශයෙන් වර්ණනාවට ලක් වන්නේ,

1. දිඹුලාගල කාශ්‍යප හිමියන් ය.  2. පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් ය.
3. රීස් ඩේවිස් මැතිතුමා ය.  4. බුද්ධඝෝෂ හිමියන් ය.

10. පාලි ටීකා ග්‍රන්ථ වැඩි වශයෙන් ලියවුණු යුගය වන්නේ,

1. අනුරාධපුර යුගයේ දී ය.  2. පොළොන්නරු යුගයේ දී ය.
3. දඹදෙණි යුගයේ දී ය.  4. කෝට්ටේ යුගයේ දී ය.

11. 'අභිධම්මත්ථපුරාණටීකාව' කෘතියේ රචකයා වන්නේ,

1. බුද්ධඝෝෂ හිමි ය.  2. බුද්ධදත්ත හිමි ය.
3. කාශ්‍යප හිමි ය.  4. උපසේන හිමි ය.

12. දිඹුලාගල කාශ්‍යප හිමියන් රචනා කළැයි සැලකෙන කෘති අතරට අයත් නොවන කෘතිය වන්නේ,

1. අභිධම්මත්ථපුරාණටීකාව  2. බාලාවබෝධන
3. අනාගතවංස  4. බාලාවතාරය

13. 'බාලාවබෝධන' යනු

1. සිංහල ව්‍යාකරණ ග්‍රන්ථයකි.  2. පාලි ව්‍යාකරණ ග්‍රන්ථයකි.
3. සංස්කෘත ව්‍යාකරණ ග්‍රන්ථයකි.  4. උපදේශ ග්‍රන්ථයකි.

14. පොළොන්නරු යුගයේ දී පාලි සාහිත්‍යයට එක් වූ සාහිත්‍යාංගයක් වන්නේ,

1. ප්‍රකරණ ග්‍රන්ථ  2. අටුවා ග්‍රන්ථ
3. ටීකා ග්‍රන්ථ  4. ව්‍යාකරණ ග්‍රන්ථ

15. දිඹුලාගල කාශ්‍යප හිමියන් හැඳින්වීම සඳහා භාවිත කළ අභිධානයක් වන්නේ,

1. මහාසංඝනායක  2. සංඝ පරිනායක
3. සාගරමති  4. සංඝරාජ

16. දිඹුලාගල කාශ්‍යප හිමියන් වැඩසිටි යුගය වන්නේ,

1. අනුරාධපුර යුගය  2. පොළොන්නරු යුගය
3. දඹදෙණි යුගය  4. කුරුණෑගල යුගය

17. රජවීමට පෙර ''කිත්ති'' නමින් හැඳින්වූයේ කවර රජතුමා ද,

1. දුටුගැමුණු රජතුමා  2. පරාක්‍රමබාහු රජතුමා
3. පළවන මහා විජයබාහු රජතුමා  4. පළවන ජයබාහු රජතුමා

18. මෙරට පරිහානියට පත්වූ උපසම්පදාව නැවතත් පිහිටුවීම සඳහා උපසම්පදා භික්ෂූන් වැඩම කරවූයේ කුමන රටින් ද,

1. බුරුමයෙන් 2. තායිලන්තයෙන්
3. ඉන්දුනීසියාවෙන් 4. දඹදිවෙන්

19. දිඹුලාගල කාශ්‍යප හිමියන්ගේ සුපේෂල ශික්ෂාකාමීත්වය වර්ණනා කොට ඇත්තේ,

1. ත්‍රිපිටකයේ 2. පොළොන්නරු සෙල්ලිපියේ
3. මහාවංශයේ 4. සාරත්ථදීපනී විනය ටීකාවේ

20. මහා කාශ්‍යප මාහිමි සම්බුද්ධ ශාසනය නමැති අහසෙහි පූර්ණ චන්ද්‍රයා මෙන් දීප්තිමත්ව බැබළුණු බව දක්වා ඇත්තේ,

1. මහාවංශයේ 2. ත්‍රිපිටකයේ
3. සාරත්ථදීපනී විනය ටීකාවේ 4. අනාගත මොහවිච්ඡෙදනී ටීකාවේ

*මලක් ලෙස පිපෙන්නට පෙරුම් පුරනා දරුවනේ*

*නොවී නියගලා මල පිපෙන්න කුසුමක්ව*

*ලෝ සතට සුවද දෙන*